Department of Education, Sabaragamuwa Province/ Weekly School



පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

**01)** කිසියම් උෂ්ණත්වයක දී 1 $dm^3$ සංවෘත භාජනයක් තුළ $XeF_2$ හා $OF_2$ මිශ්‍ර කර සමතුලිත වීමට ඉඩ හැරිය විට පහත සමතුලිතය ඇති වේ.

$$XeF_2(g) + OF_2(g) \rightleftharpoons XeOF_2(g) + F_2(g)$$

සමතුලිතතාවයේ දී භාජනය තුළ $XeF_2(g)$ 0.6 mol ක් ද $OF_2(g)$ 0.30 mol ක් ද $XeOF_2(g)$ 0.1 mol ක් ද $F_2(g)$ 0.40 mol ක් ද අඩංගු වේ. භාජනය තුළ ඇති $XeOF_2(g)$ ප්‍රමාණය එම උෂ්ණත්වයේ දී ම 0.20 mol තෙක් වැඩි කරගැනීමට පද්ධතියට බාහිරින් එකතු කළ යුතු $OF_2(g)$ ප්‍රමාණය කවරේ ද?

**02)** සල්ෆියුරිල් ක්ලෝරයිඩ් , (තයෝනයිල් ක්ලෝරයිඩ් , $SO_2Cl_2$ ) තරමක් ඉහළ උෂ්ණත්වයේ දී වියෝජනය වී පහත සමතුලිතය ඇති කර ගනී.

$$SO_2Cl_2(g) \rightleftharpoons SO_2(g) + Cl_2(g)$$

650 K දී මෙහි $K_c$ අගය 0.045 mol $dm^{-3}$ වේ.

(a) $SO_2Cl_2$ 8.25 g ක සාම්පලයක් 1 $dm^3$ භාජනයක් තුළ 650 K උෂ්ණත්වයේ සමතුලිතතාවයට එළඹෙන තුරු තබා ඇත. සමතුලිතතාවයේ දී එක් එක් සංඝටකයේ සාන්ද්‍රණය කවරේ ද?

(b) වියෝජනය වී ඇති $SO_2Cl_2$ භාගය කවරේ ද?

(c) ප්‍රතික්‍රියා භාජනයට $Cl_2$ 5g ක් එක් කළ හොත් $SO_2Cl_2$ වල නව වියෝජන භාගය කලින්ට වඩා වැඩි වේ ද? අඩු වේ ද?

**03)** 298 K දී බෙන්සිල්ඇමීන් සහ ඇනිලීන්වල විඝටන නියත පිළිවෙලින් $2.2 \times 10^{-5}$ mol $dm^{-3}$ සහ $4.2 \times 10^{-10}$ mol $dm^{-3}$ වේ. 298 K දී KOH වලට සාපේක්ෂව සාන්ද්‍රණය 0.1 mol $dm^{-3}$ වූ ද ඇනිලීන් වලට සාපේක්ෂව සාන්ද්‍රණය 0.01 mol $dm^{-3}$ වූ ද බෙන්සිල් ඇමීන් වලට සාපේක්ෂව සාන්ද්‍රණය 0.02 mol $dm^{-3}$ වූ ද ජලීය ද්‍රාවණයක pH අගයත් එහි අඩංගුවන අයනවල සාන්ද්‍රණත් සොයන්න.

298 K දී B සහ D නමැති ඒක ආම්ලික දුර්වල භස්ම දෙකක විඝටන නියත පිළිවෙලින් $4 \times 10^{-4}$ mol $dm^{-3}$ සහ $6 \times 10^{-4}$ mol $dm^{-3}$ වේ. 298 K දී B වලට සාපේක්ෂව සාන්ද්‍රණය 0.1 mol $dm^{-3}$ වූ ද D වලට සාපේක්ෂව සාන්ද්‍රණය 0.2 mol $dm^{-3}$ වූ ද ජලීය ද්‍රාවණයක pH අගයත් එහි අඩංගු වන $BH^+(aq)$ සහ $DH^+(aq)$ අයනවල සාන්ද්‍රණත් සොයන්න.